AAT - මූල්‍ය වාර්තාකරණය

2026 ජනවාරි විභාගය - පුණරීක්ෂණ අභ්‍යාස

සැකැසුම - සංදීප ජයසේකර

01 වන ප්‍රශ්නය

සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගමේ 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ.

සීමාසහිත Chemiro (පෞද්ගලික) සමාගමේ
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

මාර්තු 31 දිනට	2025	2024
ජංගම නොවන වත්කම්:		
දේපළ පිරියත, සහ උපකරණ	220,400	156,930
සමුච්චිත ක්ෂය	(129,100)	(101,460)
ධාරණ අගය	91,300	55,470
ජංගම වත්කම්:		
තොග	106,420	
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	110,426	
මුදල් සහ මුදල්වලට සමාන දෑ	15,400	
	232,246	
මුළු වත්කම්	323,546	
ස්කන්ධ සහ වගකීම් :		
ස්කන්ධ :		
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 12,800,000)	128,000	128,000
රඳවාගත් ඉපැයීම	125,596	114,939
	253,596	242,939
ජංගම නොවන වගකීම් :		
බැංකු ණය	30,400	31,400
සේවක ප්‍රතිලාභය පාරි පාරිතෝෂික සඳහා වෙන්කිරීම	21,480	26,700
	51,880	58,100
ජංගම වගකීම් :		
වෙළඳ ගෙවිය යුතු මුදල්	5,400	420

බැංකු ණය	2,000	11,500
ගෙවිය යුතු ණය පොළිය	7,430	1,040
ගෙවිය යුතු ආදායම් බදු	3,240	5,640
	18,070	18,600
මුළු ස්කන්ධය සහ වගකීම්	323,546	319,639

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම රු.3,400,0000/- කි. සමාගමේ පොළි සහ බදු පෙර ලාභය රු.23,437,000/- ක් වූ අතර සාමාන්‍ය කොටස්කරුවන් සඳහා අතුරු ලාභාංශ 2024 දෙසැම්බර් 31 දින ගෙවා ඇත.

(2) 2024 ඔක්තෝම්බර් 01 දින, යන්ත්‍රයක් රු. මිලියන රු. 9.5 කට විකුණන ලදී. යන්ත්‍රයේ පිරිවැය රු. මිලියන 15 ක් වූ අතර, 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 7.5 ක් විය. යන්ත්‍ර පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට වසර 10 ක් පුරා ක්ෂය කරනු ලබයි. එම විකුණූ යන්ත්‍රයට ප්‍රතිස්ථාපනයක් වශයෙන්, 2025 මාර්තු 31 දින නව යන්ත්‍රයක් මිලට ගත් අතර, එය එදිනම ප්‍රාග්ධනිත කරන ලදී.

(3) වර්ෂය සඳහා වන පොළි වියදම රු.8, 100,000/- ක් වන අතර, වර්ෂය තුළදී සමාගම විසින් රු. 10,000,000/- ක තට බැංකු ණය මුදලක් ලබාගන්නා ලදී.

(4) වර්ෂය සඳහා වන පාරිතෝෂික වෙන්කිරීම රු.1,750,000/- ක් වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමා සහිත Chemiro (පෞද්ගලික) සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වන ක්‍රමය යටතේ පිළියල කරන්න.

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner

02 වන ප්‍රශ්නය

සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගමේ 2024 මාර්තු 31 දිනට සහ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශක පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශක

(රු.000)

මාර්තු 31 දිනට	2024	2023
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	21,500	20,100
සමුච්චිත ක්ෂය	(2,900)	(2,400)
ධාරණ අගය	**18,600**	**17,700**
ජංගම වත්කම්:		
තොග	16,800	5,000
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	5,545	18,410
මුදල් සහ මුදල් වලට සමාන දෑ	2,050	2,200
	24,395	25,610
මුළු වත්කම්	**42,995**	**43,310**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,500,000)	25,000	25,000
රඳවාගත් ඉපැයීම්	6,600	4,100
	31,600	**29,100**
ජංගම නොවන වගකීම:		
දිගු කාලීන ණය	5,400	6,000
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	390	350
	5,790	6,350
ජංගම වගකීම්:		
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්	5,170	7,590
ණය මත ගෙවිය යුතු පොළිය.	435	120
ගෙවිය යුතු ආදායම් බදු	-	150
	5,605	7,860
මුළු ස්කන්ධය සහ වගකීම්	42,995	43,310

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවයන් වර්ෂය සඳහා බදු පසු ලාභය රු.2,730,000/- ක් වූ අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.720,000/- ක් විය.

(2) වර්ෂය තුළදී, සමාගම විසින් රු.2,000,000/- ක නව දිගු කාලීන ණය මුදලක් ලබාගෙන ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය මත පොළී වියදම රු. 1,000,000/- ක් විය.

(3) 2023 අප්‍රේල් 01 දින, සමාගම විසින් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති යන්ත්‍රයක් රු.200,000/- ක මුදලකට විකුණා ඇත. මෙම යන්ත්‍රයේ පිරිවැය රු.700,000/- ක් විය. 2023 අප්‍රේල් 30 දින විකුණන ලද යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගන්නා ලද අතර, එය එදිනම ප්‍රාග්ධනීන කරන ලදී.

(4) වර්ෂය තුළදී, සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශ වශයෙන් සමාගම විසින් රු.230,000/- ක් ගෙවන ලදී.

(5) වර්ෂය සඳහා සේවක පාරිතෝෂික සඳහා වන ප්‍රතිපාදනය රු.120,000/- ක් විය.

ඔබ විසින් කළ යුතු දෑ:

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමා සහිත සූර්යා (පෞද්ගලික) සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කරන්න.

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

03 වන ප්‍රශ්නය

2023 අප්‍රේල් 01 දින, **සීමාසහිත Enrich පොදු සමාගම**, **සීමාසහිත Kanrich පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන්, 80% ත් රු. මිලියන 65 කට අත්පත් කරගන්නා ලදී. **සීමා සහිත Enrich පොදු සමාගමේ** සහ **සීමාසහිතKanrich පොදු සමාගමේ** 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

(රු .000)

2024 මාර්තු 31 දිනට	**සීමාසහිත Enrich පොදු සමාගම**	**සීමාසහිත Kanrich පොදු සමාගම**
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට	90,000	60,000
සීමාසහිත Kanrich පොදු සමාගමෙහි සිදු කළ ආයෝජනය	65,000	-
ජංගම වත්කම්:		
තොග	12,000	18,000
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	18,000	17,000
සීමාසහිත Kanrich පොදු සමාගමෙන් ලැබිය යුතු මුදල	2,000	-
මුදල් සහ මුදල් වලට සමාන දෑ	6,000	2,500
	38,000	37,500
මුළු වත්කම්	193,000	97,500
ස්කන්ධය සහ වගකීම:		
ස්කන්ධය :		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	120,000	70,000
රඳවාගත් ඉපැයීම්	26,900	12,000
	146,900	82,000
ජංගම නොවන වගකීම්:		
සේවක ප්‍රතිලාභ	7,500	3,100
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	32,000	9,050
සීමාසහිත Enrich පොදු සමාගමට ගෙවිය යුතු මුදල	-	2,000
ගෙවිය යුතු ආදායම් බදු	6,600	1,350
	38,600	12,400
මුළු ස්කන්ධය සහ වගකීම්	**193,000**	**97,500**

JMC Learning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනට, පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය (Non-Controlling Interest (NCI)] රු. මිලියන 20 ක් වූ අතර**, සීමාසහිත Kanrich පොදු සමාගමෙහි** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම, ඒවායේ පොත් අගයට සමාන වේ. අත්පත් කරගත් දිනට **සීමාසහිත Kanrich පොදු සමාගමෙහි** රඳවාගත් ඉපැයීම් රු.4,500,000/- ක් විය.

(2) 2023 අප්‍රේල් 01 දිනට, ධාරණ අගය රු.2,000,000/- ක් වූ යන්ත්‍රයක් රු.3,000,000/- කට **සීමාසහිතEnrich පොදු සමාගම** විසින් සීමා සහිත Kanrich පොදු සමාගමට 2023 අප්‍රේල් 01 දින විකුණා ඇත. පදිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් විය. යන්ත්‍රය විකිණීමෙන් ලද ලාභය, **සීමාසහිත Enrich පොදු සමාගමේ** වෙනත් ආදායම් තුළ ඇතුළත් කර ඇත.

(3) වර්ෂය තුළදී, රු.6,000,000/-ක් වටිනා භාණ්ඩ, **සීමාසහිත Kanrich පොදු සමාගම** විසින් **සීමාසහිත Enrich පොදු සමාගමෙන්** මිලදීගෙන ඇත. එම භාණ්ඩවලින් 1/5 ක ප්‍රමාණයක් නොවිකිණී **සීමාසහිත Kanrich පොදු සමාගම** තුළ පවතී. **සීමාසහිත Enrich පොදු සමාගමේ** විකුණුම් ප්‍රතිපත්තිය වනුයේ පිරිවැය මත 20% ක ලාභයක් පවත්වා ගැනීමයි. මෙම ගනුදෙනුවට අදාලව 2024 මාර්තු 31 දිනට ගෙවිය යුතු රු. මිලියන 2 ක මුදලක්, **සීමාසහිත Enrich පොදු සමාගමේ** ලැබිය යුතු මුදල් තුළත් **සීමා සහිතKanrich පොදු සමාගමේ** ගෙවිය යුතු මුදල් තුළත් ඇතුළත් කර ඇත.

(4) 2024 මාර්තු 31 දින සිදුකරන ලද හානිකරණ පරීක්ෂණයේදී අනාවරණය වුයේ සමාගම අත්පත් කර ගැනීමෙන් ඇති වූ කීර්තිනාමය, රු.6,000,000/- කින් හානිකරණය වී ඇති බවයි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) සීමාසහිත Kanrich පොදු සමාගම අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය ගණනය කරන්න.

(ලකුණු 04)

(b) 2024 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්තව ප්‍රකාශනය පිළියෙල කරන්න.

(ලකුණු 11)

(මුළු ලකුණු 15)

04 වන ප්‍රශ්නය

2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත Vikash පොදු සමාගම** විසින් **සීමාසහිත Prakash පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 90% ක් රු. මිලියන 105 කට අත්පත් කරගන්නා ලදී. අත්පත් කරගැනීමෙන් ඇති වූ කීර්තිනාමය රු. මිලියන 17 කි.

සීමාසහිත Vikash පොදු සමාගමේ සහ **සීමාසහිත Prakash පොදු සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශන පහත සඳහන් පරිදි විය.

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශන

(රු .000)

	සීමාසහිත Vikash පොදු සමාගම	**සීමාසහිත Prakash පොදු සමාගම**
විකුණුම්	1,035,200	624,000
විකුණුම පිරිවැය	(703,900)	(443,000)
දළ ලාභය	331,300	181,000
වෙනත් ආදායම්:		
වෙනත් ආදායම්	3,600	900
වත්කම් ඉවත් කිරීමේ ලාභ	200	620
වියදම්:		
බෙදා හැරීමේ වියදම්	(64,000)	(34,000)
පරිපාලන වියදම්	(116,000)	(67,000)
මූල්‍ය වියදම	(18,500)	(23,400)
බදු පෙර ලාභය	**136,600**	**58,120**
ආදායම් බදු	(40,980)	(16,564)
වර්ෂය සඳහා ලාභය	95,620	41,556
වෙතත් විස්තීර්ණ ආදායම	355	**-**
මුළු විස්තීර්ණ ආදායම	**95,975**	**41,556**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී, **සීමාසහිත Vikash පොදු සමාගම** විසින් රු.60,000,000/-ක් පිරිවැය වූ භාණ්ඩ, පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් **සහිතව සීමා සහිත Prakash පොදු සමාගමට** විකුණන ලදී. 2025 මාර්තු 31 දිනට, **සීමාසහිතPrakash පොදු සමාගමේ** ගබඩාව තුළ **සීමාසහිත Vikash පොදු සමාගමෙන්** මිලට ගත් භාණ්ඩ වලින් රු.5,000,000/- ක් වටිනා තොගයක් නොවිකිණී ඉතිරිව ඇත.

(2) **සීමාසහිත Vikash පොදු සමාගමේ** වෙතත් ආදායම් තුළ **සීමාසහිත Prakash පොදු සමාගමට** සැපයූ උපදේශන සේවා සඳහා එම සමාගම විසින් ගෙවන ලද රු.3,000,000/- ක කළමනාකරණ ගාස්තු ඇතුළත් වේ.

(3) 2024 ඔක්තොම්බර් 01 දින, **සීමාසහිත Prakash පොදු සමාගම** 10% ක වාර්ෂික පොළී අනුපාතිකයක් යටතේ රු.2,000,000/- ක ණය මුදලක් **සීමාසහිත Vikash පොදු සමාගමෙන්** ලබාගෙන ඇත. **සීමාසහිත Prakash soup සමාගම** විසින් 2024/25 වර්ෂ සඳහා වන පොළිය, **සීමාසහිත Vikash පොදු සමාගම** වෙත සම්පූර්ණයෙන්ම ගෙවා ඇත.

(4) 2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත Prakash පොදු සමාගම** විසින් එදිනට එහි ගිණුම් පොත්වල ධාරණ අගය රු.9,500,000/- ක් වන යන්ත්‍රයක් රු.10,000,000/- ක මිලකට, **සීමාසහිත Vikash පොදු සමාගමට** විකුණක ලදී. 2024 අප්‍රේල් 01 දිකට, එම යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 කි.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න. (ලකුණු 10)

05 වන ප්‍රශ්නය

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමා සහිත Omega සමාගමෙහි** ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) 2024 ජනවාරි 01 දින, නව නිෂ්පාදිතයන් සංවර්ධනය කිරීමට අදාලව සමාගම විසින් වෙළෙඳපොළ සමීක්ෂණය සිදුකර ඇති අතර, මෙම අරමුණ සඳහා සමීක්ෂණ ආයතනයකට රු. මිලියන 2 ක් ගෙවා ඇත.

(2) 2024 මාර්තු 20 දින, මෙම නිෂ්පාදිතයට අදාල පේටන්ට් (ස්වාධිකාර) අයිතිය, රු.75,000/- ක වියදමක් දරා ලියාපදිංචි කර ඇත.

(3) වර්ෂය තුළදී, සමාගමේ කළමනාකරුවන් සඳහා විදේශ රටක පුහුණුවක් ලබා දීමට සමාගම විසින් රු. මිලියන 10 ක් වියදම් කර ඇත. මෙම පුහුණුවෙහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමෙහි කළමනාකරුවන්ගේ කාර්ය සාධනය වර්ධනය වනු ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 38 - අස්පෘශ්‍ය වත්කම අනුව, ඉහත එක් එක් පිරිවැය, අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත හැකිද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු - 05)

06 වන ප්‍රශ්නය

(1) **සීමාසහිත Beta** සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2024 ජුනි 30 දින ලබාදෙන ලදී. මූල්‍ය වර්ෂයේ අවසන් දිනෙන් පසුව පහත සඳහන් සිදුවීම සිදුවී ඇති බවටත් ඒවා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැළකිලට ගෙන නොමැති බවටත් මූල්‍ය කළමනාකරුට පසුව අනාවරණය විය:

(1) සමාගමේ නිෂ්පාදිතයක් භාවිත කිරීමෙන් හටගන්නා ලද සෞඛ්‍ය හානියකට අදාල වන්දි වශයෙන් සමාගමෙන් රු.1,000,000/- ක වන්දියක් ඉල්ලා 2024 මාර්තු 31 දින **සීමාසහිත Beta සමාගමේ** ගනුදෙනුකරුවෙකු විසින් සමාගමට විරුද්ධව නඩුවක් පවරා ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය දුන් දිනය දක්වා පවතින සාක්ෂි මත පදනම්ව, සමාගමට මෙම වන්දිය ගෙවීම සඳහා අඩු සම්භාවිතාවයක් පවතින බව සමාගමේ නීතිඥවරයා විශ්වාස කරනු ලබයි.

(2) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභය මත අවසාන ලය 2024 අප්‍රේල් 10 දින **සීමාසහිත Beta සමාගමේ** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලදි.

(3) ආදායම් බද්ද ගණනය කිරීමේදී, සමාගම විසින් ඉඩ දුන් වියදම් ලෙස සළකන ලද රු. මිලියන 2 ක් වූ ඇතැම් වියදම ඉඩ නොදෙමින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුවක් නිකුත් කර ඇත. සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව, 2024 අප්‍රේල් 30 දින රු. මිලියන 1.5 ක වියදම ඉඩ නොදීමට ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එකඟ වී ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත එක් එක් සංසිද්ධිය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත Beta සමාගමේ** මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

07 වන ප්‍රශ්නය

(a) වායු සම්භාරණ විකිණීමේ හා නඩත්තු සේවා සැපයීමේ සමාගමක් වන, **සීමාසහිත ABC සමාගමෙන්** පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

සීමාසහිත ABC සමාගම, රු.22,000/- ක මාසික ගාස්තුවකට වසර දෙකක් සඳහා වායු සමීකරණ යන්ත්‍රයක් නඩත්තු සේවා සහිතව විකිණීමට **සීමාසහිත Ranga සමාගම** සමඟ 2024 අප්‍රේල් 01 දින ගිවිසුමකට එළඹ ඇත. මෙය වෙන වෙනම විකුණන්නේ නම්, වායු සමීකරණ යන්ත්‍රයේ වෙළෙඳ පොළ වටිනාකම රු.360,000/- ක් වන අතර, නඩත්තු සේවාව සඳහා මාසික ගාස්තුව රු.8,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 15 - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින් වන අයභාරය අනුව, 2025 මාර්තු 31 දිනෙන් සහ 2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා ඉහත ගනුදෙනුවෙන් ඇති වන අයභාරය හඳුනා දක්වන්න.

(ලකුණු 04)

JMC vLearning "your virtual learning partner"

08 වන ප්‍රශ්නය

(b) **සීමාසහිත Sard සමාගම**, වායු සමීකරණ අලෙවි කිරීම හා කඩත්තු සේවා සැපයීමේ නිරතව සිටී. 2023 අප්‍රේල් 01 දින සමාගම රු.15,000/- ක මාසික ගාස්තුවකට වායු සමීකරණ යන්ත්‍රයක් නඩත්තු සේවාවන් සහිතව සැපයීම සඳහා පාරිභෝගිකයෙකු සමඟ වසර 2 ක ගිවිසුමකට එළඹ ඇත. මෙය වෙන වෙනම අලෙවි කරන්නේ නම්, වායු සමීකරණ යන්ත්‍රයේ වෙළෙඳ පොළ මිල රු.240,000/- ක් වන අතර, නඩත්තු සේවාව සඳහා මාසික ගාස්තුව රු.6,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 15 - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය අනුව, 2024 මාර්තු 31 දිනෙන් සහ 2025 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂ සඳහා ඉහත ගනුදෙනුවෙන් ඇතිවන අයභාරය හඳුනා දක්වන්න.

09 වන ප්‍රශ්නය

(b) 2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත Lak සමාගම** (කල්බදු ගැනුම්කරු) නව යන්ත්‍රයක් මිලට ගැනීම සඳහා සීමා සහිත XYZ Finance සමාගම (කල්බදු දීමනාකරු) සමඟ කලබදු ගිවිසුමකට එළඹෙන ලදී. කල් බදු ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබ වෙත දී ඇත:

යන්ත්‍රයේ පිරිවැය	රු. 7,000,000/
කල්බද්ද ආරම්භයේදී සිදු කළ මූලික ගෙවීම	රු. 1,000,000/
කල්බදු කාල සීමාව	වර්ෂ 4
ව්‍යංග පොළී අනුපාතය	වාර්ෂිකව 14%
වාර්ෂික කබදු වාරිකය	රු .2,059,229/-

පළමු වාර්ෂික කල්බදු වාරිකය, 2025 මාර්තු 31 දින ගෙවූ අතර, කල්බදු ගිවිසුම අනුව, කල්බදු කාල සීමාව අවසානයේදී යන්ත්‍රයේ හිමිකම **සීමාසහිත Lak සමාගම** වෙත මාරුවේ. සමාගම විසින් වත්කම භාවිත කිරීමේ හිමිකම, වත්කමේ කල්බදු කාල සීමාව පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

ඉගෙන කල්බදු ගනුදෙනුව සම්බන්ධයෙන්, **සීමාසහිත Lak සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සහ 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන් පිළියෙල කරන්න

(ලකුණු 06)

10 වන ප්‍රශ්නය

(b) 2023 අප්‍රේල් 01 දින, **සීමා සහිත පබ්ලික් ලීසිං සමාගම** විසින් **සීමාසහිත Singhe සමාගමට** මෝටර් ලොරි රථයක් වර්ෂ 5 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ විකුණා ඇත. මෝටර් ලොරි රථයේ සාධාරණ වටිනාකම රු.6,800,000/- ක් වූ අතර, **සීමා සහිත Singhe සමාගම** විසින් 2023 අප්‍රේල් 01 දින, අත්තිකාරම් මුදලක් වශයෙන් රු.2,000,000/- ක් ගෙවා ඇත. වාර්ෂික කල් බදු වාරිකයක වටිනාකම රු 1,534,934/- ක් වන අතර, එය එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී ගෙවිය යුතු වේ. ව්‍යංග (implied) පොලි අනුපාතිකය වර්ෂයකට 18% ක් වේ. සීමාසහිත Singhe සමාගම විසින් කල් බද්දේ පළමු වාරිකය, 2024 මාර්තු 31 දින ගෙවා ඇත.

ඔබ විසින් කළ යුතු දෑ:

සීමාසහිත පබ්ලික් ලීසිං සමාගමේ (කල්බදු හිමියා) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා /දිනට අදාලව පහත සඳහන් ලෙජර් ගිණුම් පිළියෙල කරන්න:

(i) ලැබිය යුතු කල්බදු ගිණුම (ලකුණු 04)

(ii) නොඉපැයූ මූල්‍ය ආදායම් ගිණුම. (ලකුණු 02)

11 වන ප්‍රශ්නය

(B) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Beta සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

	රු.(1000)
2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු පෙර ලාභය	12,400
2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු අය කළ හැකි ලාභය	20,000
2024 අප්‍රේල් 01 දිනට විලම්භිත බදු වගකීම	3,500

දේපළ පිරියත සහ උපකරණ වල විස්තර පහත පරිදි වේ. රු. (.000)

වත්කම්	පිරිවැය	2025 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියා හළ අගය)	2025 මාර්තු 31 දිනට බදු අරමුණු අනුව සමුච්චිත ක්ෂය වීම (ප්‍රාග්ධන දීමනාව)
ඉඩම	10,000	10,000	-
ගොඩනැගිලි	54,000	38,500	22,500

සමාගමට අදාල ආදායම් බදු අනුපාතය 30% කි.

(a) 2025 මාර්තු 31 දිනට විල පිහිත බදු වත්කම / වගකීම ගණනය කරන්න.

(b) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බදු වියදම ගණනය කරන්න.

JMC vLearning "your virtual learning partner"

12 වන ප්‍රශ්නය

සීමාසහිත ABC සමාගමේ 2024 මාර්තු 31 දිනට, පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී:

(1) දේපළ, පිරියත සහ උපකරණ වල තොරතුරු පහත පරිදි වේ: (රු.000)

වත්කම්	**පිරිවැය**	**2024 මාර්තු 31 දිනට ධාරණ අගය (ගිණුම්කරණ ලියාහල අගය)**	**2024 මාර්තු 31 දිනට බදු අරමුණු සඳහා වන සමුච්චිත ක්ෂය (ප්‍රාග්ධන දීමනාව)**
ඉඩම	8,000	8,000	-
මෝටර් වාහන	12,000	6,500	9,800

(2) 2023 අප්‍රේල් 01 දිනට, විලම්භිත බදු වගකීම රු.650,000/- කි.

(3) **සීමාසහිත ABC සමාගම,** වාර්ෂිකව 30% ක අනුපාතයක් යටතේ ආදායම් බදු ගෙවනු ලබන අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු අයකළ හැකි ලාභය රු.2,600,000/- කි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනට, විලම්භිත බදු වත්කම / වගකීම. (ලකුණු 03)

(b) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු වියදම. (ලකුණු 02)

13 වන ප්‍රශ්නය

(a) 2023 ජනවාරි 01 දින, **සීමා සහිත සන් සෝලා සමාගම,** විසින් මන්නාරමේ සූර්ය විදුලි බලාගාරයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ අතර, 2023 නොවැම්බර් 30 දින එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී. බලාගාරයේ පිරිවැය මත ප්‍රාග්ධනිත කළ හැකි ණය පිරිවැය හඳුනාගැනීමට සමාගමේ කළ නොකාරිත්වය බලාපොරොත්තු වේ.

(1) ඉදිකිරීමේ මුළු පිරිවැය රු. මිලියන 400 ක් වූ අතර, සූර්ය බලාගාරය ඉදිකිරීම කොන්ත්‍රාත්තුකරුට පහතසඳහන් පරිදි ගෙවීම් කරන ලදී:

JMC vLearning "your virtual learning partner"

විස්තරය	ගෙවීම කළ දිනය	රු.(1000)
පළමු බිල්පත	2023.02.01	50,000
දෙවන බිල්පත	2023.03.31	100,000
තෙවන බිල්පත	2023.09.01	140,000
අවසාන බිල්පත	2023.11.30	110,000
		400,000

(2) XYZ බැංකුවෙන් ණය මුදල ලබාගෙන ඇති අතර, එය සූර්ය විදුලි බලාගාරය ඉදි කිරීම සඳහාම සම්පූර්ණයෙන් යොදවා ඇත. ඉදිකිරීම් සඳහා වැයවූ ඉතිරි මුදල, **ABC බැංකුවෙන්** ලබාගත් ණය මුදලින් යොදවා ඇත. මෙම මූල්‍ය පහසුකම් පිළිබඳව විස්තර පහත පරිදි වේ:

බැංකුව	ණය මුදල (රු. 1000)	වාර්ෂික පොලි අනුපාතය	ලබාගත් දිනය
ABC බැංකුව	550,000	12%	2023.04.30
XYZ බැංකුව	200,000	13%	2023.01.01

(3) මෙම ණය මුදල් දෙකෙහිම ප්‍රාග්ධන ආපසු ගෙවීම 2024 ජනවාරි 01 දින ආරම්භ කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුමකරණ ප්‍රමිත (LKAS) 23 - ණය ගැණුම් පිරිවැය ප්‍රමිතයට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට සූර්ය විදුලි බලාගාරය මත ප්‍රාග්ධනිත කළ යුතු ණය ගැනුම් පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 04)

14 වන ප්‍රශ්නය

(a) 2021 අප්‍රේල් 01 දින රු.6,500,000/- කට මෝටර් රථයක් අත්පත් කරගත් අතර, එහි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 කි. මෝටර් රථ, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. 2024 මාර්තු 31 දින, සමාගම විසින් හානිකරණ පරීක්ෂාවක් (impairment test) සිදුකළ අතර, එහිදී මෝටර් රථයේ ඉවත්කිරීමේ වියදම් අඩු කළ පසු සාධාරණ වටිනාකම රු.2,300,000/- ක් සහ එහි භාවිතයට ගැනීමේ අගය (value in use) රු.2,400,000/- ක් බව අනාවරණය කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 36 - වත්කම් හානිකරණය අනුව, මෝටර් රථයේ හානිකරණ අලාභය ගණනය කරන්න